**උඩුනුවර ප්‍රාදේශීය සභාව.**
**මහනුවර දිස්ත්‍රික්කය.**
**-----------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන.**
**----------------**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**
**-------------------------------**

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 14 දින ද, ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2015 මැයි 11 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2016 ජුලි 22 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

**1.2 මතය වියාචනය.**
**-----------------**

මෙම වාර්තාවේ 1.3.1, 1.3.2, 1.3.4 ඡේදවල දක්වා ඇති වැදගත් කරුණු හේතුවෙන්, විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මට නොහැකි විය. ඒ හේතු කොට ගෙන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි.

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**
**----------------------------------------**

**1.3.1 ගිණුම්කරණ අඩුපාඩු**
**----------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වැඩසටහන් 02 සෞඛ්‍ය සේවා යටතේ සේවා සඳහා ගාස්තුවලට අදාළව රු.289,280 ක ලියාපදිංචි කිරීමේ ගාස්තු හා වැඩසටහන් 03 භෞතික සැළසුම් යටතේ සේවා සඳහා ගාස්තුවලට අදාළ රු.740,530 ක පෙර සැරි ගාස්තු, ලෙජර් ගිණුමේ ඇතුළත්ව තිබූ නමුත්, මූල්‍ය හා මෙහෙයුම් ප්‍රකාශයට ඇතුළත් කර නොතිබුණි.

(ආ) 2014 වර්ෂයට අදාළ නොගෙවූ වැටුප් හා වේතන සඳහා රු.138,828 ක මුදලක් ණයහිමියෝ ලෙස ඉදිරියට ගෙනවිත් තිබූ අතර, ඒ වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුළ දී රු.702,888 ක් ගෙවා තිබුණි. මේ අනුව, වැඩිපුර ගෙවා තිබූ රු.564,060 ක මුදල ගිණුම්වලින් ගැළපීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) මූල්‍ය ප්‍රකාශන සමග ඉදිරිපත් කර තිබූ දේපළ හා පිරියතවලට අදාළ ගිණුම්කරණ සටහන්වල දේපළ හා පිරියතවලට සමාලෝචිත වර්ෂයේ එකතු කිරීම් රු.39,256,966 ක් වුවත්, එය රු.66,256,966 ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් දේපළ හා පිරියත රු.27,000,000 ක් වැඩියෙන් ප්‍රාග්ධනයට දක්වා තිබුණි. එසේම, ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායකවීමේ ගිණුම ද එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ඈ) ලැබියයුතු මුද්දර ගාස්තු ගිණුමේ ශේෂය ලෙජරය අනුව, රු.31,033,898 ක් වුවත්, මූල්‍ය ප්‍රකාශනවල එය රු.36,154,871 ක් ලෙස දක්වා තිබීම හේතුවෙන්, මුද්දර ගාස්තු ආදායම රු.5,120,973 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂය තුළ ගිවිසුම්වලට එළඹීමට කටයුතු නොකළ එකතුව රු.99,986 ක් වූ වැසිකිළි ඉදි කිරීමේ ව්‍යාපෘති 02 ක වටිනාකම ණයහිමියන් යටතේ ගිණුම්ගත කර තිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂය තුළ ප්‍රාග්ධන වත්කම් වැඩි දියුණු කිරීම සඳහා අවස්ථා 05 කදී වැය කරන ලද රු.1,081,063 ක මුදලක් ප්‍රාග්ධනිත කර නොතිබුණි.

(උ) සමාලෝචිත වර්ෂය තුළ දී ස්ථාවර තැන්පතු 07 ක් මුදල් කර ආපසු ලබා ගෙන ඇතත්, වර්ෂයේ එකී කාල සීමාවට අදාළ රු.359,053 ක පොළී ආදායම් ගිණුම්ගත කර නොතිබුණි.

(ඌ) සමාලෝචිත වර්ෂයේ මුළු අයභාරය ගිණුම්කරණ සටහන් අංක 02 අනුව, රු.33,866,863 ක් වුවත්, එය මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ රු.32,866,863 ක් ලෙස දක්වා තිබීම නිසා, අයභාරය රු.1,000,000 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.

(එ) සමාලෝචිත වර්ෂයේ ලී බඩු හා උපකරණ සහ කාර්යාලයීය උපකරණ වෙන්දේසියෙන් ලද රු.58,750 ක මුදල ආදායමක් ලෙස ගිණුම්ගත කර තිබූ නමුත්, එම භාණ්ඩවල පිරිවැය අදාල වත්කම් ගිණුම්වලින් ඉවත් කර නොතිබුණි.

(ඒ) සමාලෝචිත වර්ෂයේ මාස 04 කට අදාළව ගෙවියයුතු දායක විශ්‍රාම වැටුප රු.32,907 ක් පොදු සැපයුම් ණයහිමියන් යටතේ හා නොගෙවූ වැටුප් හා වේතන යටතේ දෙවරක් ගිණුම්ගත කර තිබුණි.

(ඔ) ඉදිරි වර්ෂයට අදාළව සමාලෝචිත වර්ෂයේ දී ලැබී තිබූ රු.115,097 ක වරිපනම් බදු සමාලෝචිත වර්ෂයට අදාළ ලැබීමක් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ඕ) 2015 දෙසැම්බර් 31 දිනට සේවක ණය ශේෂය ණය ලේඛනය අනුව, රු.7,602,443 ක් වුවත්, මූල්‍ය ප්‍රකාශනවල රු.8,299,991 ක් ලෙස දක්වා තිබුණි.

### 1.3.2 නොසැසඳු පාලන ගිණුම්

---------------------------

ගිණුම් විෂයයන් 07 කට අදාළ පාලන ගිණුම් අනුව ශේෂයන්ගේ එකතුව රු.181,430,577 ක් වුවත්, උපලේඛන අනුව එම ශේෂයන්ගේ එකතුව රු.157,359,342 ක් වූයෙන්, රු.24,071,235 ක නොසැසඳීමක් නිරීක්ෂණය විය.

### 1.3.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

------------------------------------

**(අ) ලැබියයුතු ගිණුම්.**

---------------------

2015 දෙසැම්බර් 31 දිනට ලැබියයුතු ගිණුම් ශේෂවල එකතු වටිනාකම රු.58,526,720 ක් වූ අතර, එයින් අවුරුදු 05 ක කාලයක් ඉක්මවා තිබූ ගිණුම් ශේෂ එකතුව රු.12,435,675 ක් හා අවුරුදු 01 ත් 05 ත් අතර කාලයට අයත්ව තිබූ ගිණුම් ශේෂ එකතුව රු.10,613,363 ක් වී තිබුණි.

(ආ) **ගෙවියයුතු ගිණුම්.**

සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට ගෙවියයුතු ගිණුම් ශේෂවල එකතු වටිනාකම රු.45,325,890 ක් වූ අතර, එයින් අවුරුදු 01 ක කාලයක් ඉක්මවා තිබූ ගිණුම් ශේෂවල එකතුව රු.33,266,106 ක් වී තිබුණි.

### 1.3.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

ගිණුම් විෂයයන් 04 කට අදාළ අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරිම හේතුවෙන්, එකතුව රු.191,412,629 ක් වූ ගනුදෙනු විගණනයේ දී සතුටුදායක ලෙස සත්‍යාපනය/ සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

### 1.3.5 නීති, රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම.

**පහත සඳහන් අනුකූල නොවීමේ අවස්ථා නිරීක්ෂණය විය.**

| නීති, රීති හා රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති. | |
| 217 | සභාව සතු සියලුම ඉඩම් හා ගොඩනැගිලි පිළිබඳව ලේඛනයක් නඩත්තු කර නොතිබුණි. |
| (ආ) 1990 ඔක්තෝබර් 10 දිනැති අංක 41/90 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | සෑම මාස 06 කට වරක්ම එක් එක් වාහනයේ දැවෙන ඉන්ධන ප්‍රමාණය පරීක්ෂා කළයුතු වුවත්, වාහන 07 ක දැවෙන ඉන්ධන ප්‍රමාණය පරීක්ෂා කර නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ ආදායම ඉක්මවූ පුනරාවර්තන වියදම රු.9,709,300 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ආදායම ඉක්මවූ පුනරාවර්තන වියදම රු.6,094,894 ක් වුයෙන්, ඉකුත් වර්ෂයට සාපේක්ෂව රු.3,614,406 ක ඌනතාවයේ වැඩිවීමක් දක්නට ලැබුණි.

### 2.2 විග්‍රාහාත්මක මූල්‍ය සමාලෝචනය

(අ) **මෙහෙයුම් ආදායමට ඌනතාවය.**

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂය තුළ මූල්‍ය ප්‍රතිඵලයේ ඌනතාවය මෙහෙයුම් ආදායමේ ප්‍රතිශතයක් වශයෙන් ගත් විට වර්ධනයක් පෙන්නුම් කෙරේ.

(ආ) **මුළු ආදායම සහ මුළු වියදම සැසඳීම.**

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂ 02 ක තුළ මුළු වියදම මුළු ආදායමෙහි ප්‍රතිශතයක් ලෙස ගත් විට එම ප්‍රතිශතයේ ඉහළ යෑමක් පෙන්නුම් කෙරෙන අතර, එය මූල්‍ය පාලනය සම්බන්ධයෙන් සතුටුදායක තත්ත්වයක් නොවීය.

(ඇ) **ඌනතාවයේ වැඩිවීම.**

සමාලෝචිත වර්ෂයේ සමස්ත ඌනතාවය ඉකුත් වර්ෂයේ ඌනතාවය සමග සැසඳීමේ දී, ඌනතාවයේ රු.3,614,406 ක වැඩිවීමක් විය. 2015 වර්ෂයේ දි ආදායම් විෂයයන් 03 ක සියයට 12 සිට සියයට 26 ක ආදායම් අඩුවීම හා වියදම් විෂයයන් 02 ක සියයට 20 සිට සියයට 61 දක්වා වියදම් වැඩිවීම මෙයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 2.3 ආදායම් පරිපාලනය.

### 2.3.1 ආදායම් රැස් කිරීමේ කාර්යය සාධනය.

ලේකම්වරයා විසින් සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | 2015.01.01 දිනට හිඟ ශේෂය | බිල් කිරීම් | 2015 වර්ෂය දුන් වට්ටම් | 2015 ලැබීම් හිගයෙන් ලැබීම් | 2015 බිල් කිරීම්වලින් ලැබීම් | 2015.12.31 දිනට හිග ශේෂය |
|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | **11,668,770** | **4,944,332** | **74,388** | **1,278,507** | **2,313,938** | **12,946,269** |
| බදු කුළී | **271,316** | **1,168,080** | **--** | **209,984** | **946,762** | **282,650** |
| බලපත්‍ර ගාස්තු | **--** | **3,330,325** | **--** | **--** | **3,330,325** | **--** |
| වෙනත් ආදායම් | **2,148,369** | **39,733,581** | **--** | **15,120,176** | **8,048,307** | **18,713,467** |
| එකතුව | | | | | | **31,942,386** |

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.31,942,386 ක හිග ආදායම් ශේෂයක් නිරීක්ෂණය විය.

### 2.3.2 වරිපනම් හා බදු

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) 2015 ජනවාරි 01 දිනට හිඟ වරිපනම් හා බදු ශේෂය රු.11,668,770 ක් වූ අතර, 2015 දෙසැම්බර් 31 දින දක්වා බිල් කිරීම් රු.4,944,332 ක් විය. මින් 2015 දෙසැම්බර් 31 දින වන විටත් අය කර තිබුණේ පිළිවෙළින් රු.1,278,507 ක් හා රු.2,273,227 ක් පමණි. මෙය ප්‍රතිශතයක් ලෙස සියයට 11 ක් හා සියයට 46 ක් වූයෙන්, ආදායම් රැස් කිරීම දුර්වල මට්ටමක පැවතින.

(ආ) සමාලෝචිත වර්ෂයේ කරන ලද නියැදි විගණන පරීක්ෂණයට අනුව, වරිපනම් අය කිරීමේ දී සැළකියයුතු මූල්‍ය අක්‍රමිකතාවයක් අනාවරණය වූ බැවින්, ආරම්භක හිඟ ශේෂය, වර්ෂයේ බිල් කිරීම් හා 2015 දෙසැම්බර් 31 දිනට හිගය වශයෙන් ගිණුම්වල දක්වා තිබූ පිළිවෙළින් රු.11,532,343, රු.4,930,332 ක් හා රු.12,795,843 ක ශේෂවල නිවැරදිතාව පිළිගත හැකි තත්ත්වයක නොතිබුණි.

(ඇ) වරිපනම් ලෙජරය නිසි පරිදි නඩත්තු කර නොතිබූ අතර, බොහෝ වරිපනම් අංක ව්‍යාජ ලෙස පරිගණකයෙන් ද ඉවත් කර තිබූ බැවින්, වරිපනම් අය කිරීම් නිසි පරිදි පරීක්ෂා කිරීමට නොහැකි විය.

### 2.3.3 බදු කුළී

2015 ජනවාරි 01 දිනට හිඟ හිටි බදු කුළිය රු.271,316 ක් වූ අතර, 2015 දෙසැම්බර් 31 දින දක්වා බිල් කිරීම් රු.1,168,080 ක් විය. මින් 2015 දෙසැම්බර් 31 දින වන විටත් අය කර තිබුණේ පිළිවෙළින් රු.209,984 ක් හා රු.946,762 ක් පමණි. මේ හේතුවෙන්, සමාලෝචිත වර්ෂය අවසාන දිනට රු.282,650 ක හිඟ බදු කුළී ශේෂයක් පැවති අතර, එම මුදල් අය කර ගැනීමට 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 159(1) වගන්තිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

### 2.3.4 අක්කර බදු.

2015 ජනවාරි 01 දිනට හිඟ අක්කර බදු ශේෂය රු.136,426 ක් වූ අතර, 2015 දෙසැම්බර් 31 දින දක්වා බිල් කිරීම් රු.14,000 ක් විය. 2015 වර්ෂයේ දී කිසිදු මුදලක් අය කර ගෙන නොතිබූ අතර, 2015 දෙසැම්බර් 31 දිනට රු.150,426 ක හිඟ ශේෂයක් තිබුණි.

### 2.3.5 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2015 දෙසැම්බර් 31 දිනට උසාවි දඩ රු.1,054,792 ක් හා මුද්දර ගාස්තු රු.29,054,424 ක් ලැබියයුතුව තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්ය මණ්ඩල පරිපාලනය

2015 දෙසැම්බර් 31 දිනට සභාවේ පුරප්පාඩු තනතුරු 20 ක් හා අතිරික්ත තනතුරු 06 ක් පැවතුණි.

**3.2 දෘෂ්‍ය අක්‍රමිකතා.**

---------------------

ප්‍රාදේශීය සභාවේ දෛනික වරිපනම් බදු ලැබීම් හා වෙළඳ බලපත්‍ර ගාස්තු අය කිරීම් සම්බන්ධයෙන් කරන ලද නියැදි විගණන පරීක්ෂාවේ දී 2011 සිට 2015 අප්‍රේල් 30 දක්වා වූ කාල පරිච්ඡේදයට අදාළව රු.1,234,483 ක මූල්‍ය අක්‍රමිකතාවයක් සිදු කර තිබුණි.

**3.3 කොන්ත්‍රාත් පරිපාලනය.**

--------------------------

**3.3.1 එලමල්දෙණිය දස්කර පාර (උවයිස් හාජියාර් මාවත) වෙල් යායේ ආරක්ෂිත බැම්ම ඉදි කිරීම රු.359,277**

------------------------------------------------------------------------------------------------------------------

මෙම කර්මාන්තය සම්බන්ධයෙන් 2016 මාර්තු 21 දින කරන ලද භෞතික පරීක්ෂාවෙන් පහත කරුණු අනාවරණය විය.

(අ) ඇස්තමේන්තු ප්‍රකාරව ආරක්ෂිත බැම්ම සඳහා 6"x9" ප්‍රමාණයේ කළු ගල් යෙදියයුතු වුවත්, එම ප්‍රමාණයට වඩා වැඩි 20"x8", 14"x8" යනාදී ප්‍රමාණයේ විශාල ගල් යොදා බැම්ම ඉදි කර තිබුණි.

(ආ) ආරක්ෂිත බැම්මේ මුදුනත 1:5 සිමෙන්ති වැලි මිශ්‍රණයෙන් බදාම යෙදියයුතු වුවත්, යොදා තිබූ බදාම තට්ටුව අතින් කැඩිය හැකි මට්ටමින් දුර්වල මට්ටමක පැවතුණි.

(ආ) ඉදි කර තිබූ බැම්මේ පොළොවෙන් ඉහළට තිබූ කොටසේ ජල කාන්දු සිදුරු දක්නට නොලැබුණි.

**3.3.2 ලුණුගම සිට ගිරාගම මැණික්බෝව මාර්ගය වැඩි දියුණු කිරීම - රු.500,000**

------------------------------------------------------------------------------------------

මෙම කර්මාන්තය සම්බන්ධයෙන් 2016 මාර්තු 21 දින කරන ලද භෞතික පරීක්ෂාවේදී පහත කරුණු අනාවරණය විය.

(අ) ආරක්ෂක බැම්ම ඉදි කිරීමේ දී 6"x9" ප්‍රමාණයේ කළු ගල් යෙදියයුතු වුවත්, එම ප්‍රමාණයට වඩා වැඩි 20"x8", 14"x8" ප්‍රමාණයේ විශාල ගල් යොදා බැම්ම ඉදි කර තිබුණි.

(ආ) ඇස්තමේන්තුව ප්‍රකාරව බැම්මේ මතු පිට කපරාරුව හා බැම්ම ඉදි කිරීම සඳහා 1:5 ප්‍රමාණයේ සිමෙන්ති, වැලි බදාම මිශ්‍රණයක් යොදා ගතයුතු වුවත්, යොදා ගෙන තිබූ මිශ්‍රණය එම ප්‍රමාණයට වඩා අඩුවෙන් යොදා ගැනීම හේතුවෙන් මතු පිට කපරාරුව පහසුවෙන් කැඩිය හැකි මට්ටමේ දුර්වලව පැවතුණි.

**3.3.3 උරුලැවත්ත පත්තිනි දේවාලය අසළ සිට වාන්ගමුව පාර වැඩි දියුණු කිරීම - රු.237,500**

---------------------------------------------------------------------------------------------

මෙම කර්මාන්තය සම්බන්ධයෙන් 2016 මාර්තු 21 දින කරන ලද භෞතික පරීක්ෂාවේදී පහත කරුණු අනාවරණය විය.

(අ) මෙම මාර්ගය සඳහා යොදා තිබූ ආරක්ෂිත බැම්ම දෙපස වැඩ නිම කර නොතිබීම හේතුවෙන්, මෙහි ඉදිරි පැවැත්ම අවිනිශ්චිතව පැවතුණි.

(ආ) බැම්ම සඳහා 6"x9" ප්‍රමාණයේ කළු ගල් යෙදියයුතු වුවත්, එම ප්‍රමාණයට වඩා විශාල ගල් යොදා තිබුණි.

(ඇ) ඇස්තමේන්තු ප්‍රකාරව බැම්ම මතු පිට 1:5 ප්‍රමාණයේ බදාම මිශ්‍රණයක් යොදා ගතයුතු වුවත්, යොදා ගෙන තිබූ බදාම මිශ්‍රණය පහසුවෙන් කැඩිය හැකි මට්ටමේ දුර්වල තත්වයක පැවතුණි.

**3.4 වාහන පාලනය**

----------------

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සභාවේ වාහන 02 ක දින 35 ක ධාවන සටහන්වල වාහනය භාවිතා කළ නිලධාරියා අත්සන් යොදා නොතිබූ අතර, මේ ආකාරයට ගමන් කළ නිලධාරියා තහවුරු නොකළ කි.මී.3158 ක ගමන් සඳහා ඉන්ධන වෙනුවෙන් රු.37,501 ක් වැය කර තිබුණි.

(ආ) දෛනික ධාවන සටහන්වල ගමනේ විස්තර හා ගමන් කළ නිලධාරීන් සම්බන්ධව සටහන් කළයුතු වුවත්, වාහන 03 ක 2015 මැයි මාසයේ සිට සැප්තැම්බර් මාසය දක්වා කාල පරිච්ඡේදය තුළ ලේකම්වරයාගේ උපදෙස් පරිදි රාජකාරී කටයුතු යනුවෙන් සටහන් කරමින් කි.මී.11738 ක් ධාවනය කර, රු.157,463 ක් ඉන්ධන සඳහා වැය කර තිබුණි.

(ඇ) සියලුම රජයේ වාහනවල රාජ්‍ය ලාංඡනය යෙදියයුතු වුවත්, සභාව සතු දැනට ලියාපදිංචි කර ඇති වාහන 04 ක1994 අගෝස්තු 03 දිනැති අංක 26/92/01 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව රාජ්‍ය ලාංඡනය හෝ ආයතනයේ නම පින්තාරු කර නොතිබුණි.

**4. යහපාලනය හා ගිණුම්කටයුතු භාවය**

--------------------------------------

**4.1 අයවැය පාලනය**

----------------------

සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙළ කර තිබුණු අයවැය ලේඛනය අනුව, ඇස්තමේන්තු ආදායම් හා වියදම්, තථ්‍ය ආදායම් හා වියදම් සමග සැසඳීමේ දී, ආදායම් විෂයයන් 04 ක සියයට 15 සිට සියයට 46 දක්වා ද, වියදම් විෂයයන් 07 ක සියයට 18 සිට සියයට 61 දක්වා ද විචලනයක් නිරීක්ෂණය වූ බැවින්, අයවැය ලේඛනය ඵලදායී පාලන කාරකයක් වශයෙන් යොදා ගෙන නොතිබුණි.

**4.2 වාර්ෂික ප්‍රසම්පාදන සැළැස්ම.**

--------------------------------

වාර්ෂික ප්‍රසම්පාදන සැළැස්මක් පිළියෙළ කර නොතිබුණි.

**4.3 අභ්‍යන්තර විගණනය.**

------------------------

අභ්‍යන්තර විගණන වාර්තා පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.

## 4.4 වත්කම් කළමනාකරණය.

-------------------------------

**නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්.**

------------------------------------------

(අ) 2013 වර්ෂයේ දී මුද්‍රණය කරන ලද රු.437,064 ක් වටිනා උඩුනුවර වංශ කතාව ඇතුළත් පොත් 736 ක්, වසර 02 ක පමණ කාලයක සිට අලෙවි නොවී පැවතුණි.

(ආ) සභාව සතු රු.116,000 ක් වටිනා යතුරු පැදියක් සහ රු.1,525,000 ක් වටිනා මෝටර් රථයක් පිළිවෙළින් වසර 03 ක් හා වසර 04 ක අතර කාලයක් භාවිතයට ගැනීමකින් තොරව නිෂ්ක්‍රීයව පැවති අතර, ධාවනයෙන් ඉවත් කර තිබුණු අංක 252 – 6359 දරන කැබ් රථය අපහරණය කිරීමට හෝ අලුත්වැඩියා කර, ප්‍රයෝජනයට ගැනීමට හෝ කටයුතු කර නොතිබුණි.

## 4.5 ක්‍රියාකාරී සැලැස්ම

--------------------

සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙළ කර නොතිබුණි.

## 5. පද්ධති හා පාලනය.

------------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) අභ්‍යන්තර පාලනය

(ආ) ගිණුම්කරණය

(ඇ) ආදායම් පාලනය

(ඈ) කොන්ත්‍රාත් පරිපාලනය

(ඉ) ණයගැති හා ණයහිමි පාලනය

(ඊ) වාහන පාලනය